මාගේ අංක:-13/03/03
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
කවුඩුලු වැව ව්‍යාපාරය,
මැදිරිගිරිය.
**2020.03.10**

**කවුඩුලුවැව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ**
**සියළුම සාමාජික මහත්ම / මහත්මීන් වෙත.**

## 2020 යල කන්නය සඳහා වූ පෙර වගා රැස්වීම 2020.03.10 - කවුඩුලුවැව ව්‍යාපාරය

**1994 අංක 13 දරණ වාරිමාර්ග(සංසෝධන)පනතට අනුකූලව කවුඩුලුවැව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා වූ පෙර වගා රැස්වීම 2020.03.10 දින පෙ.ව.9.30 ට කවුඩුලු වැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.**

### සහභාගී වූ රාජ්‍ය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| **1.** | ආර්.ඩී.කේ.රාජසූරිය | නේවාසික ව්‍යාපාර කළමනාකරු | නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| **2.** | පි.ජී.දඹෝරගම | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| **3.** | එම්.ආර්.ජී.ටී.කේ.ඒකනායක | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| **4.** | යූ.ජී.සී.ජී. උඩගමගේ | ප්‍රාදේශිය නිලධාරී | ගොවිජන සේවා මධ්‍යස්ථානය-මැදිරිගිරිය |
| **5.** | කේ. ටී. ජී. අසංග | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| **6.** | ආර්.පී.එන්.එන්. මධුශංක | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| **7.** | එච්.ඒ.ආර්. ප්‍රදීප් | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| **8.** | එන්.එස්.නානායක්කාර | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| **9.** | ඩී.කේ.එන්.පී.ආර්.කේ. ගුණවර්ධන | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |

### සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිත මහතුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| **1.** | කේ.බි.අශෝක කරුණාසේන | ගරු සභාපති | එක්සත් 1බි යාය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **2.** | ඩබ් ජී එච් එම් ප්‍රදීප් කුමාර | ගරු ලේකම් | එක්සත් 1බි යාය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **3.** | එච් එම් නිමල් හේරත් බණ්ඩා | ගරු සභාපති | සි.පි.පුර පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| **4.** | ජී.ඒ.ෂෙල්ටන් පෙරේරා | ගරු සභාපති | කාලිංග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **5.** | එස්.එම්.සමන් සමරකෝන් | ගරු සභාපති | මණ්ඩලගිරිය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **6.** | බී ජී සුනිල් තිලකරත්න | ගරු සභාපති | රංකෙත බෙදුම් ඇළ ගොවි සංවිධානය |
| **7.** | ඒ එම් ධම්මික ප්‍රියන්ත | ගරු සභාපති | අරුනළු බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **8.** | ජේ පී සේනාරත්න | ගරු සභාපති | සුහද එක්සත් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **9.** | ඒ ඩබ්. සිසිර ජයරත්න | ගරු ලේකම් | ශ්‍රී නාග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **10.** | යූ ඕ ජී වික්‍රමසිංහ | ගරු ලේකම් | විජයපුර විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **11.** | එන් ජී ඩිංගිරි බණ්ඩා | ගරු සභාපති | විජිත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **12.** | ඩී ආර් වජිර දසනායක | ගරු සභාපති | සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **13.** | කේ අජිත් ප්‍රියන්ත | ගරු ලේකම් | සමගි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **14.** | ජී. ධර්මසිරි ගුණරත්න | ගරු සභාපති | මැණික්සොරොව්ව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **15.** | එම් කේ විද්‍යාරත්න | ගරු සභාපති | සාම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **16.** | ලලිත් සූරියප්පපෙරුම | ගරුලේකම් | සාම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **17.** | යූ ජී ගුණවර්ධන | ගරු සභාපති | ගොවිසෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **18.** | ටී ජී මාලා මංගලිකා | ගරුලේකම් | ගොවිසෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **19.** | එච් ජී එස් ප්‍රේමසිරි | ගරු භාණ්ඩාගාරික | ගොවිසෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **20.** | යූ පී සමන්ත කුමාර | ගරු සභාපති | මහවැලි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **21.** | ඩබ් එම් නිමල් ජයසිංහ | ගරු භාණ්ඩාගාරික | මහවැලි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **22.** | එල් ජී ජයවර්ධන | ගරු සභාපති | මහින්දපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **23.** | කේ.එම්.ඒ.ජී.සෙනවිරත්න | ගරු සභාපති | ප්‍රගති බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **24.** | කේ.එම්.ඩබ්.කරුණාරත්න | ගරු ලේකම් | ප්‍රගති බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **25.** | යූ.ජී.එන්.යූ.කුමාර | ගරු සභාපති | පුබුදු බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **26.** | ඩබ් එම් රුවන් පුෂ්ප කුමාර | ගරු සභාපති | සේසත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **27.** | යූ.ජී.වසන්ත උදය කුමාර | ගරු සභාපති | ඩී.එස්.සේනානායක බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **28.** | ඩී.එම්.කුයින්ටන් දිසානායක | ගරු සභාපති | ශ්‍රී විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **29.** | ඩබ්. එම්. අනුර බණ්ඩාර | ගරු ලේකම් | ශ්‍රී විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **30.** | ජී.ආර්.ප්‍රසාද් ප්‍රියන්කර හේරත් | ගරු ලේකම් | නාගරපුර සහන බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **31.** | ර්.ජේ. රණතුංග | ගරු භාණ්ඩාගාරික | නාගරපුර සහන බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **32.** | ඊ ඩී පී එදිරිසිංහ බණ්ඩාර | ගරු සභාපති | වීරකැප්පෙටිපොල බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **33.** | පී ඒ සුසන්ත කුමාර | ගරු සභාපති | මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **34.** | ටී ජී මනෝජ් අසංක | ගරු ලේකම් | මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **35.** | පී ඒ එස් ජේ බණ්ඩාර | ගරු භාණ්ඩාගාරික | මහසෙන් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| **36.** | එස්. කේ. වික්‍රමසිංහ | ගරු ලේකම් | එක්සත් ගොවි ගොවි සංවිධානය |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකරු ආර්.ඩී.කේ.රාජසූරිය මහතා විසින් පැමිණි රාජ්‍ය නිලධාරීන් හා ගොවි සංවිධාන නිලධාරීන් පිළිගන්නා ලදි.

## අරමුණ පැහැදිලි කිරීම:- (නේවාසික ව්‍යාපාර කළමනාකරු).

- **පැවති ජල අර්බුධ හා ඉන් අනතුරුව පැමිණි අධික වර්ෂා තත්වය නිසා 2019/20 මහ කන්නය ආරම්භ කිරීම ප්‍රමාද වුණි. මෙවන් හේතු රසක් නිසා මෙම කන්නයේ වගාවන්ට විවිධ රෝග හා පළිබෝධ හානි පැමිණ ඇති බව පැහැදිලි වේ. කෙසේ වෙතත් මෙම තත්වයන්ගෙන් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා මේ වන විට කෘෂිකර්ම උපදේශක කාර්යාලය මගින් දැනුවත් කිරීම් ආරම්භ කර ඇත.**
- **ඉහත කී පරිදි වගාවන් වල පවතින විවිධ ගැටලු මෙන්ම ගොවීන් තුළ පැණ නැගී ඇති ගැටලු අවම කිරීම සඳහා ගොවි නායකයින් විසින් ක්‍රමවත් පරිදි අදාල රැස්වීම් සංවිධානය කළ යුතු වේ.**
- **ජලය ඉතා අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් දැඩි ප්‍රයත්නයක් දරන අතර මෙම කටයුතු සඳහා කෙත් ඇළ නියෝජිත වරුන් සහ ගොවි සංවිධානවල ජල පාලක වරු උපරිම සහය දිය යුතුය.**

## පසුගිය වාර්ථාව ප්‍රගති සමාලෝචනය කිරීම.

- රක්ෂිත සීමා සලකුණු කිරීම යටතේ ගොවිසෙත ගොවි සංවිධානය විසින් මායිම් කණු 100 ක් නිර්මාණය කරමින් පවතී

- ලෝයන්ට් සම්බන්ධව නේවාසික ව්‍යාපෘති කළමනාකරු විසින් අදහස් විමසීමේදී පුබුදු ගොවං සංවිධානයේ ගරු සභාපති පැවසූයේ ඊට අදාල ගොවීන්ගේ තොරතුරු නැවත අදාල ආයතන මගින් ලබා ගනිමින් පවතින බවයි.

- අක්කර 50 අමුණ යම් යම් අවස්ථා වල කඩා දමන බවට පසුගිය කමිටු වල ප්‍රකාශ වූ අතර ඊට පිළිතුරු ලෙස සී. පී. පුර පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසූයේ දැනට ජලය ඉතා අධික ලෙස අනවශ්‍ය බැවින් හඳුනා නොගත් එම පිරිස් විසින් කඩා දැමීම නතර වී ඇති බවයි.

- නීති විරෝධී ලෙස වැලි කැණීම් සම්බන්ධව පැවති ගැටලු සඳහා නිශ්චිත නීතිමය උපදෙස් දැනට ලැබී තිබෙන බව නේවාසික ව්‍යාපෘති කළමනාකරු පැවසූ අතර වැලි මංකඩ සඳහා නිරීක්ෂණ වාර්තාවක් හෝ නිර්දේශයක් භූ විද්‍යා පතල් කැණීම් කාර්යංශයෙන් තවම ලැබී නොමැති බවද දැන්විය.ප්‍රවාහන කටයුතු සඳහා බලපත්‍ර අවශ්‍ය නොවන නමුත් දැනට වැලි කැණීම් සිදුවනවානම් එම කටයුතු නීති විරෝධී ඒවාම බව දැන්විය

- කාලිංග ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසූයේ අදාල වැලි මංකඩ පරීක්ෂා කිරීම සඳහා භූ විද්‍යා පතල් කැණීම් කාර්යංශය වෙත ගාස්තුවක් ගෙවිය යුතු බවයි. ඉන් අනතුරුව අදාල ක්‍රියාවලිය ආරම්භ වන බවද දැන්විය. දැනට විවිධ කණ්ඩායම් නීති විරෝධී ලෙස වැලි කැණීම් හා කෘෂි මාර්ග හරහා ප්‍රවාහනය කිරීම් සිදු කරන අතර එම කෘෂි මාර්ග නඩත්තු කිරීම සඳහා ගොවි සංවිධාන වරින් වර විශාල මුදලක්ද වැය කරනු ඇත. මෙම තත්වය පාලනය කිරිම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ගයක් යෙදිය යුතු බව පැවසීය.

- විජයපුර විජය ගොවි සංවිධානයේ නඩත්තු කටයුතු වලදී පස් වැටී අවහිර වී තිබූ ඇළ මාර්ගයන් නැවත යථා පරිදි සකස් කළ බව විජය ගොවි සංවිධානයේ ගරු ලේකම් පැවසීය.

- සමගි ගොවි සංවිධානයේ ඇළ නඩත්තු කටයුතු සම්බන්ධ ගැටලු වලට අදාලව එම ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසූයේ විශේෂයෙන්ම FC 27 ඇළ ඇතුලුව ඇළ මාර්ග කිහිපයක් දැනට ගොවීන් හා එක්ව නඩත්තු කරමින් පවතින බවයි.

- කුඹුරු බට ගේට්ටු හිගතාවය පිළිබඳව ඉදිරිපත් වී තිබූ ගැටලුවේදී වාරිමාර්ග ඉංජිනේරු තුමා පැවසූයේ කුඹුරු බට සඳහා ගේට්ටු ලබා දීම ඉතා අපහසු කාර්යයක් බැවින් ඩී ඇළ හා කෙත් ඇළ සඳහා පමණක් ගේට්ටු ලබා දිය හැකි බවයි.

- වගාවන් සඳහා මොණරුන්ගෙන් සිදු වන හානිය පිළිබඳව නේවාසික ව්‍යාපාර කළමනාකරු පැවසුයේ මේ සඳහා තිරසාර විසඳුමක් මේ වන තෙක් කිසිදු ආයතනයකින් ලැබී නොමැති බවයි.

- ගැට කැකිරි වගාව සම්බන්ධ පසුගිය කමිටු වල තත්වයන් පිළිබඳ විමසීමේදී මැණික් සොරොවුව ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ මෙම වගාව ආර්ථික වශයෙන් ඉතා වැදගත් එකක් වන නිසාත් දැනට ජනප්‍රිය වගාවක් වී ඇති නිසාත් එම ආයතන විසින් ඉදිරි කන්නයේ සිට වගාවට අවශ්‍ය දැල් ලබා දීමට ද කටයුතු කරමින් පවතින බවයි.

<u>පසුගිය වාර්තාවේ පැවති වාරි ගැටලු සඳහා ලබා දුන් විසඳුම්</u>

- මහවැලි ගොවි සංවිධානයේ ඇළ මාර්ග කිහිපයක පැවති ගැටලු පිළිබඳව සාකච්ඡා කළ අතර ඒ වෙන්වෙන් අදහස් දැක්වූ එම ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ වැලි කැණීම් නිසා සිදුවන හානිය අවම කිරීම සඳහා එම ස්ථානයේ දැන්වීම් පුවරුවක් සවි කළ බවයි. මෙම ගොවි සංවිධානයටම අයත් අංක 53 කුඹුරු ඉඩම නිරන්තරයෙන් යටවීම නිසා ඩෙංගු අවධානමක් පවතී. ඒ සම්බන්ධව වාරිමාර්ග ඉංජිනේරු පැවසුයේ එහි රඳා පවතින ජලය සියල්ල ඉවත් කිරීම සඳහා ඊට සුදුසු බටයක් යෙදීමට කටයුතු කරන බවයි.

- මහසෙන් ගොවි සංවිධානයේ සයිබන් නිර්මිතය ප්‍රතිසංස්කරණය කිරීමට මූලික ස්ථානීය පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව වාරිමාර්ග ඉංජිනේරු දැන්වීය.

- වීර කැප්පිටිපොළ ගොවි සංවිධානයේ ගරු සභාපති විසින් ප්‍රධාන ඇළ අපද්‍රව්‍ය එක් වීම නිසා අවහිර වී ඇති බව දන්වා තිබූ අතර වාරිමාර්ග ඉංජිනේරු පැවසුයේ ගොවීන් විසින්ම මෙම අපද්‍රව්‍ය බැහැර කිරීම් කරන නිසා ඒ පිළිබඳව විමසිලිමත් විය යුතු බවයි.

- හැරවුම් නිර්මිත පිළිබඳව ශ්‍රී විජය ගොවි සංවිධානයේ ගරු සභාපති ඉදිරිපත් කර තිබූ ගැටලුවට අදාලව වාරිමාර්ග ඉංජිනේරු පැවසුයේ අදාල කටයුතු සඳහා අවශ්‍ය මූලික ලිපි ලේඛන දැනට සකස් කරමින් පවතින බවයි.

- විජයපුර විජය ගොවි සංවිධානයේ ගරු ලේකම් පැවසුයේ FC 06 ඇළෙහි ගැටලු ලිපියක් මගින් දැනුවත් කර ඇති බවයි. වාරිමාර්ග ඉංජිනේරු පැවසුයේ මෙම ගැටලු අදාල ඉංජිනේරු සහකාර මහතා සමග එක්ව කටයුතු කර විසඳා ගන්නා ලෙසයි.

- එක්සත් 01 බී ගොවි සංවිධානයේ ගරු සභාපති විසින් නිරන්තරයෙන් ඉදිරිපත් කරන පොහොර සහනාධාරය පිළිබඳ ගැටලුව සම්බන්ධව ද කරුණු ඉදිරිපත් කළ අතර එම ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ පොහොර හිගය යම් තරමකින් විසඳුණු නමුත් 100% ක් ම විසඳී නැති බවයි.

## <u>ලිපි ඉදිරිපත් කිරීම</u>

**මැදිරිගිරිය සුලු වාරි ව්‍යාපරයක් වන සහ ඊට අයත් පල්ලියගොඩැල්ල M R සුලු ගොවි සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක සඳහන් වන්නේ ඔවුන් වර්ෂයකට එක් කන්නයක් පමණක් වගා කරන බැවින් ඉදිරි කන්නය ආරම්භ කිරීමට පෙර මොරගහකන්ද මගින් ජලය අක්කර අඩි 3000 ක් පමණ ලබා ගෙන කවුඩුලුවැව ජලාශය හරහා එම ප්‍රෙද්ශයට ලබා දෙන ලෙසයි. නේවාසික ව්‍යාපෘති කළමනාකරු මේ පිළිබඳව ව්‍යාපාර කමිටුවෙහි අදහස් විමසන ලදී.**

- **කාලිංග ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ කවුඩුලුවැව ව්‍යාපාරයට ද ජලය සම්බන්ධව අවධානම් පවතින නිසා කවුඩුලුවැව ජලාශයෙන් ඉහත කී සුලු වාරි ව්‍යාපාර සඳහා ජලය කිසි සේත්ම නිකුත් කළ නොහැකි බවයි. ඒ වෙනුවට අදාල ජල පරිමාව මොරගහකන්ද ජලාශය හරහා කවුඩුලුවැවට ලබා දීම සිදු කළහොත් පමණක් නිකුත් කළ හැකි බව දැන්වීය.මෙම සුලු වාරි ව්‍යාපාරයන් වල එක් ගොවියෙකු සතුව ඉතා විශාල කුඹුරු ප්‍රමාණයන් පවතින අතර එම කුඹුරු අස්වැද්දීම සඳහා විශාල ජල පරිමාවක් අවශ්‍ය වන නිසා මෙම ඉල්ලීම ඉටු වුවහොත් ඉදිරියේදී විශාල ගැටලු රැසක් නිර්මාණය කිරීමටද ඉවහල් වන බව දැන්වීය.**

- රංකෙත ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ පවතින තත්වයන්ට අනුව ජලය නිකුත් කිරීම ඉතා අපහසු එකක් වන අතර වියළි කාලගුණ තත්වයන්ට ද යටත්ව කවුඩුලුවැව හරහා අක්කර අඩි 3000 ක් නිකුත් කිරීමට අවශ්‍ය නම් මොරගහකන්ද මගින් කවුඩුල්ල ජලාශය වෙත අක්කර අඩි 5000 ක් පමණ නිකුත් කළ යුතු බවයි.
- සමගි ගොවි සංවිධානයේ ගරු සභාපති පෙන්වා දුන්නේ පසුගිය කාල වකවානු වලදී දේශපාලන මැදිහත්වීම් මත මෙම ප්‍රෙද්ශයන්ට යම් යම් ජල පරිමා නිකුත් කළ බවයි. නමුත් වර්තමානයේදී මෙම ඉල්ලීමට එකඟ විය නොහැකි බවත් එකඟ වී ජලය ලබා දුනහොත් එම තත්වය පාදක කරගෙන නීත්‍යානුකූල තත්වයන් ඇතිවී ගැටලුද රැසක් නිර්මාණය වන බවත් ය.

- **<u>කන්නය සැලසුම් කිරීම:- *(ගොවි සංවිධාන සහ රාජ්‍ය ආයතන)*</u>**

<u>වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ අදහස් ඉදිරිපත් කිරීම:- *(වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුල්ල)*</u>

- මොරගහකන්ද ජලාශයේ ජලාශයේ 80% ක ජල පරිමාවක් මේ වන විට පවතී.
- අදවන විට කවුඩුලුවැව ජලාශයේ ජල මට්ටම අක්කර අඩි 93000 ක් පවතිනවා.
- මින්නේරිය ජලාශයේ ජල මට්ටම අක්කර අඩි 79000 කි.
- කවුඩුල්ල ජලාශයේ ජල පරිමාව අක්කර අඩි 100000 ක් බවට පත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

විවිධ වූ සාධාරණ හේතූන් මත 2019/20 මහ කන්නය දින දීර්ඝ කිරීමක් සිදු කර ඇති අතර ඒ මත වගාවන්ට ද විවිධ වූ බලපෑම් ඇතිවුණි. කෙසේ වෙතත් වගා කාල සටහන අනුව තවත් 01 ජල මුරයක් පමණක් නිකුත් කිරීමට ඉතිරිව ඇති අතර එයට අනුව උස් මට්ටම් සොරොවුව 03/12 දිනද පහත් මට්ටම් සෙරොවුව 03/13 දිනද විවෘත කරන බවද කමිටුවට දැන්වීය.

2019 යල් කන්නය ආරම්භ කරන විට ද ජලාශයේ මුලින් පැවති ජල ප්‍රමාණය අක්කර අඩි 6000 කින් පහළ ගොස් තිබූ අතර වපුරා අවසන් කිරීම සඳහාද වැඩි දින ගණනක් ගතවූ බව පැවසීය. එම නිසා මෙම කන්නයේදී බිම් සැකසීම සඳහා උස් මට්ටම් සොරොවුවට දින 21 ක් ද පහත් මට්ටම් සොරොවුවට දින 24 ක් ද ලෙස සැලසුම් සකස් කළ යුතු බව පැවසීය.

අනවසරයෙන් ව්‍යාපාරයේ ජලය ගොඩ ඉඩම් වලට ලබා ගැනීම් නිරන්තරයෙන් සිදු වන නිසා මෙම කන්නයේ සිට මෙම තත්වයන් පාලනය කිරීම සඳහා සියලුම පාර්ශව කටයුතු කළ යුතු බව දැන්වීය.

බෙදුම් ඇළවල් සඳහා රක්ෂිත කණු ලබා දීමේ හැකියාව පවතින අතර ගොවි සංවිධාන විසින් ඉල්ලීම් කළ යුතුය.

හැරවුම් නිර්මිත වල පවතින අවශ්‍යතාවයන් සහ ප්‍රතිසංස්කරණයන් සඳහා අවශ්‍ය කටයුතු ලිපි මගින් ඉල්ලීම් කර ඉටු කර ගත යුතුවේ.

<u>කන්නයේ වර්තමාන තත්වය හා ඉදිරි ජල අවශ්‍යතාවයන්</u>

<u>ගරු සභාපති - සේසත ගොවි සංවිධානය.</u>

දැනට පීදී ඇති ගොයම් මෙන්ම පූදින අවධියේ ගොයම්ද පවතින නිසා මෙම වගාවන්ට අතිරේක ජල මුර 01 ක් අවශ්‍ය වනු ඇත.

ගරු සභාපති - වීර කැප්පිටිපොළ ගොවි සංවිධානය.
අතිරේක ජල මුර 01 ක් අවශ්‍ය වනු ඇත.

ගරු සභාපති - රංකෙත ගොවි සංවිධානය.
පැවති අධික වර්ෂාව නිසා මෙම කන්නය ආරම්භ කිරීම ප්‍රමාද වූවා සේම කිහිප වරක්ම වැපිරීම් කළ ගොවීන්ද සිටිති. මෙම නිසා එම තත්වය දෙස අවධානය යොමු කර අතිරේක ජල මුරයක් ලබා දෙන ලෙස ඉල්ලීය.

ගරු සභාපති - එක්සත් 01 බී ගොවි සංවිධානය.
මෙම කන්නය ආරම්භ කිරීම ප්‍රමාද වීම , ජලය නිකුත් කිරීම ප්‍රමාද වීම, අධික වර්ෂාවක් කන්නය ආරම්භයේ පැවතීම, නිසි කලට පොහොර නොලැබීම වැනි කරුණු නිසා වගාව ප්‍රශස්ථ මට්ටමට පැමිණ නොමැත. එම නිසා වගාව සඳහා අතිරේක ජල මුරයක් අවශ්‍ය වේ.

ගරු සභාපති - සාම ගොවි සංවිධානය.
ඉදිරි ජල මුරය උස් මට්ටම සඳහා 03/12 දින නොව 03/14 දින නිකුත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදි.

ගරු සභාපති - පුබුදු ගොවි සංවිධානය.
ජල මුර නිකුත් කරන දිනයන් ඉහත පරිදි නැවත සංශෝධනය කිරීම මගින් වගා කාල සටහන වෙනස් වන නිසා සැලසුම් කරගත් පරිදිම ජලය නිකුත් කළ යුතුවේ. අමතර ජල මුරයක් අවශ්‍ය නම් පමණක් අද දින සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු වේ.

මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - මැදිරිගිරිය.
කන්නය ආරම්භ කිරීම ප්‍රමාද වීම , කෘමි උවදුරු හා පළිබෝධ හානි සහ මේ දින වල පවතින වියළි කාලගුණ තත්වය නිසා වගාව වර්ධනයේ පසුබෑමක් දැකිය හැක.

නේවාසික ව්‍යාපෘති කළමනාකරු.
අමතර ජල මුරය 50% ප්‍රමාණයක් පමණක් නිකුත් කළ යුතු බවත් එය මනා ලෙස ගොවි සංවිධාන විසින් කළමනාකරණය කළ යුතු බවත් දැන්වීය.

ඒ අනුව කමිටුවේ පොදු තීරණය වූයේ අමතර ජල මුරය උස් මට්ටම් මෙන්ම පහත් මට්ටම් යන සොරොවු දෙකම සඳහා 03/20 සිට 03/23 දක්වා නිකුත් කිරීම සුදුසු බවයි.

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු සභාපති - වීර කැප්පිටිපොළ බෙදුම් ඇළ ගොවි | • අපද්‍රව්‍ය එක් වී ප්‍රධාන ඇළ නිරන්තරයෙන් අවහිර වී තිබීම | එකතු වන අපද්‍රව්‍ය ඉවත් කිරීම හා අපද්‍රව්‍ය බැහැර කරන ගොවීන් හට නීත්‍යානුකූල පියවර ගැනීම. | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |

| | | | |
|---|---|---|---|
| සංවිධානය. | | | • ගොවි සංවිධාන. |
| ගරු සභාපති - ශ්‍රී නාග බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • ඩී 02 ඇළෙහි පවතින දොරවල් දෙකට ගොවීන් විසින් හානි සිදු කර තිබීම. | එවැනි කටයුතු සිදු කරන ගොවීන් හට නීත්‍යානුකූල පියවර ගැනීම. | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව<br>• ගොවි සංවිධාන. |
| ගරු සභාපති - කාලිංග බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • පසුගිය ජල මුර දෙකෙහිදීම වවුල් බෝක්කුව තුළින් ජලය අපතේ යාම හෝ නීති විරෝධී ලෙස ජලය ලබා ගැනීම | වාරිමාර්ග ඉංජිනේරු තුමා පැවසුයේ මෙම අවස්ථා දෙකෙහිම එය වසා තැබුණු බවත් විවිධ කණ්ඩායම් මෙම නිර්මිතය කඩා දමා දැනට ජලය ලබා ගන්නා තත්වයක් පැවතිය හැකි බවත්ය. | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව<br>• ගොවි සංවිධාන. |

## කෘෂි කර්ම දෙපාර්තුමේන්තුව - මූලස්ථාන කෘෂිකර්ම උපදේශක

- දැනට වගාවේ පවතින කීඩෑ උවදුරු අවධානම අවම කිරීම සඳහා මේ දින වල ගොවීන් දැනුවත් කිරීම් සිදු කෙරෙමින් පවතී.මේ සඳහා අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද ශබ්ද වාහිනී යන්ත්‍ර මගින් දැනුවත් කිරීම් කිහිපයක් ආරම්භ කර ඇත. මෙකී කීඩෑ හානිය අවම කිරීම සඳහා කුඹුරු වල පවතින ජල ප්‍රමාණයන් අවම කිරිමට ගොවීන් හට උපදෙස් දිය යුතුය.
- මෙම කන්නය අවසන් වීමත් සමග දින කිහිපයකින් යල් කන්නය ආරම්භ කරන නිසා කුඹුරු වල යම් තෙතමනයක් පැවතිය හැක. මෙම තත්වය ආධාර කරගෙන බිම් සකස් කිරීමට අවශ්‍ය ජල පරිමාව අවම කරගෙන ජලාශයේ ජලය යම් ප්‍රමාණයකින් ඉතිරි කර ගැනීමට කටයුතු කළ යුතු වේ.
- ඉදිරි යල් කන්යේ දී අප්‍රේල් මස වපුරන ගොවීන් මාස 03 ½ වී ද මැයි මස වපුරන ගොවීන් වෙතොත් මාස 03 වර්ගයේ වී භාවිතා කළ යුතුය.
- වගා කාල සටහන අනුවම වගා කටයුතු සිදු කරන ගොවීන් ඇතුළත් ගොවි සංවිධාන වෙත විශේෂ අවධානයක් යොමු කර ආදර්ශ ගොවි සංවිධාන නිර්මාණය කිරිමට ඉදිරියේ අපේක්ෂා කෙරේ.
- ඉදිරි යල් කන්නය ඉක්මණින් ආරම්භ කරන නිසා ගුණාත්මක බීජ වී සපයා ගැනීමේ ගැටලුවත් ඇති විය හැක. එම නිසා ව්‍යාපාරයේ පවතින වී අස්වැන්න තුළින්ම බිත්තර වී අවශ්‍ය තාවය සපුරාගැනීමට වැඩසටහන් සකස් කළ යුතු වේ.

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු සභාපති - වීර කැප්පිටිපොළ බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • වෙනත් බෝග වගාවන් සඳහා අවශ්‍ය බීජ සපයා ගැනීමේ අපහසුතාවයක් ඇත. | රාජ්‍ය අංශයෙන් දැනට ඉල්ලුම් කර ඇති බීජ ලැබීම ප්‍රමාද විය හැක. එම නිසා කාර්යාල මට්ටමින් ලබා දිය හැකි බීජ වෙතොත් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| ගරු භාණ්ඩාගාරික - ශ්‍රී නාග බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • කිරි සම්බා අස්වනු නෙළීම ප්‍රමාද වුවහොත් කීඩෑ උවදුර පැමිණිය හැකිද? | වගාවේ අදාල වියළිතාවය ප්‍රමාණවත් නම් අස්වනු නෙළීම ගැටලුවක් නොමැති බව මූලස්ථාන කෘෂිකර්ම උපදේශක පවසන ලදි. | • ගොවි සංවිධාන. |
| ගරු සභාපති - මහවැලි බෙදුම් ඇළ ගොවි සංවිධානය | • කීඩෑ හානි වලක්වාගැනීමට ගොවීන් අධික ලෙස මුදල් වැය කරමින් කෘෂි රසායන යෙදුවද මෙයට විසඳුම් ලෙස යෝග්‍ය පර්යේෂණ හා ක්‍රියාමාර්ග කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව නොමැති වීම. | ශ්‍රී ලංකාව විවිධ කෘෂි පාරිසරික තත්වයන් පවතින රටක් නිසා කෘමි හා පළිබෝධ උවදුරු අදියර මට්ටමින් වගාවන්ට පැමිණේ. වර්ෂය පුරාවටම මෙය සිදුවන නිසා එය පාලනය කිරීමට ක්‍රමයක් නොමැති | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | **බව මූලස්ථාන කෘෂිකර්ම උපදේශක පවසන ලදි.** | |
| ගරු සභාපති - සාම ගොවි සංවිධානය | **• දැනුවත් කිරීම් සඳහා වන දිනයන් හා වේලාවන් හදිසියේ වෙනස් වන අවස්ථා පැවති අතර ඒ මගින් ගොවි නායකයින් හා ගොවීන් විවිධ අපහසුතා වලට ලක් වීම.** | **අදාල වෙනස්වීම් ක්ෂණිකව දැනගැනීම සඳහා ආයතන හා ගොවි සංවිධාන අතර සෘජු සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම.** | **• කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව<br>• ගොවි සංවිධාන** |

## <u>ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව - ප්‍රාදේශීය නිලධාරී - මැදිරිගිරිය.</u>

- **පසුගිය දින වල පැවති පොහොර සම්බන්ධ ගැටලු ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුළ ද සාකච්ඡා කර ඇත.පොහොර ගබඩා සම්බන්ධ අපහසුතාවයන් හා ගැටලුද ඒ තුළ සාකච්ඡාවට බඳුන් කරන ලදි.**
- **ඉදිරි යල් කන්නයේ සිට පොහොර නොමිලේ ලබා දීමට නියමිතව ඇති බැවින් කඩිනමින් ලබා දිමට කටයුතු කරන බව දැන්වීය.**
- **වී වගාව සඳහා වගාව ආරම්භයේදීම යූරියා පොහොර අවශ්‍ය නොවන බැවින් මුලින් TSP හා MOP පොහොර ලබා දී පසුව යූරියා පොහොර ලබා දෙන බව පැවසීය.ඒ නිසා මෙවර යූරියා පොහොර ලැබීමේ ප්‍රමාදයක් සිදු විය හැකි බවද දැනුම් දුණි.**

<u>ගරු සභාපති - එක්සත් 01 බී ගොවි සංවිධානය.</u>

කුඩා ගැටලුවක් පදනම් කරගෙන දැනට අහිමිව ඇති මැදිරිගිරිය පොහොර ගබඩාව නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ නොවුවහොත් මෙම කන්නයේදී ද පොහොර ලැබීම ප්‍රමාද විය හැක. කෙසේ වෙතත් යල් කන්නය සඳහා අප්‍රෙල් 10 වන විට පොහොර ලබා දිය හැකි නම් එය ගොවීන්ට මහත් වූ සහනයක් බව පැවසීය.

<u>ප්‍රාදේශිය නිලධාරී</u>

ගොවි සංවිධාන වල පොහොර අවශ්‍යතාවයන් අනුව ඊට සරිලන ලෙස ගබඩා සූදානම් කර ගත යුතුය. එසේ වුවහොත් මෙම ප්‍රමාදයන්වලින් වැලකී කටයුතු කිරීමට ගොවීන්ට අවස්ථාව ලැබේ.

<u>ගරු සභාපති - පුබුදු ගොවි සංවිධානය.</u>

වගාව ආරම්භයේදී යූරියා පොහොර අවශ්‍ය වන බැවින් අනෙකුත් පොහොර වර්ගයන් සමගම යූරියා පොහෙර ද ලබා දීමට කටයුතු කළ යුතු වේ. පොහොර බෙදා හැරීම් වලදී ගබඩා පහසුකම් සැපයීම ආදී ගොවි සංවිධාන මට්ටමින් ඉටු විය යුතු වගකීම් නිසි ලෙස ඉටු කිරිමට කටයුතු කරනු ලැබේ. මෙම පොහොර අවශ්‍යතාවයන් නිසි කලට ඒ අයුරින්ම ලබා දීමට ගොවිජන සංවර්ධන නිලධාරීන් කටයුතු කළ යුතු අතර අසීරුතාවන් වලදී ගොවි නායකයින් හෝ ගොවීන් ඒ සඳහා යොමු නොකිරීමට වගා බලා ගත යුතු බව පැවසීය.

**පෙර වගා කාල සටහන සකස් කිරීම.**

**ගරු සභාපති - සාම ගොවි සංවිධානය.**
ඉදිරි යල් කන්නය සඳහා ජලය නිකුත් කිරීමේදී උස් මට්ටම් සොරොව්ව සඳහා 2020/04/20 දින ද පහත් මට්ටම් සොරොව්ව සඳහා 2020/04/25 දිනද ලෙස යොදාගත යුතු බව යෝජනා කරන ලදි.

**ගරු සභාපති - විජිත ගොවි සංවිධානය.**
සොරොවු දෙකම එක් දිනකදී විවෘත කරමින් ජලය නිකුත් කිරිම සුදුසු බවට යෝජනාවක් ගෙන එන ලදි.

**ගරු සභාපති - අරුණලු ගොවි සංවිධානය.**
2020 යල් කන්නය සඳහා ජලය ප්‍රමාණවත් පරිදි පවතින නිසා එක් දිනක සොරොවු දෙක මගින් ජලය නිකුත් කළ යුතු බව දැන්වීය.

**ගරු සභාපති - පුබුදු ගොවි සංවිධානය.**
2020/04/20 දින ජලය නිකුත් කිරිම සුදුසු බව පැවසීය.

**ගරු සභාපති - මහසෙන් ගොවි සංවිධානය.**
අඹගස්වැව ජලාශය මේ වන විටත් පිරී පවතින නිසා 2020/04/15 දින අඹගස්වැව ව්‍යාපාරයට ජලය ලබා දෙන ලෙස ඉල්ලීය.

**ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුල්ල**
සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් ගොවීන්ගේ යම් යම් අවශ්‍යතාවයන් සඳහා ඒ හා ආසන්නව සුලු ජල පරිමාවක් ඇළ මාර්ග වල නිකුත් කිරීමට හැකියාව පවතී.

## 2020 යල කන්නය සඳහා වූ පෙර වගා රැස්වීමේදී ගන්නා ලද තීන්දු තීරණ.

**01.** වගා කිරීමට යෝජිත ප්‍රදේශ - කවුඩුලුවැව හා අඹගස්වැව
**02.** වගා කිරීමට අපේක්ෂිත භෝග වර්ගය - මාස **03, 3 ½ වී**
**03.** වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - අක්කර **13500**

| අනු අංකය | කාර්යය | දින වකවානු | |
|---|---|---|---|
| | | කවුඩුලුවැව | අඹගස්වැව |
| **1** | **බිම් සැකසීම සඳහා ජලය නිකුත් කිරීම** | 2020.04.20 | 2020.04.15 |
| **2** | **බිම් සැකසීම ආරම්භ කරන දිනය** | 2020.04.20 | 2020.04.15 |

| | | | |
|---|---|---|---|
| 3 | වගා කටයුතු සඳහා ජලය නිකුත් කිරීම | 2020.04.20 | 2020.04.15 |
| 4 | බිම් සකසා අවසන් කළයුතු දිනය | 2020.05.07 | 2020.05.02 |
| 5 | වපුරා අවසන් කළයුතු දිනය | 2020.05.10 | 2020.05.05 |
| 6 | මුර ජලය ආරම්භ කරන දිනය | 2020.05.13 | 2020.05.08 |
| 7 | ගොවීන් විසින් ඇළවේලි සුද්ධ පවිත්‍ර කළ යුතු දිනය | 2020.04.08 | 2020.04.10 |
| 8 | ගොවීන් විසින් සුද්ධ පවිත්‍ර නොකරන කොටස් ගොවි සංවිධානය විසින් සුද්ධ පවිත්‍ර කළ යුතු දිනය | 2020.04.18 | 2020.04.13 |
| 9 | අවසන් වරට ජලය නිකුත් කළ යුතු දිනය | 2020.08.12 | 2020.08.07 |
| 10 | අස්වනු නෙලා අවසන් කළයුතු දිනය | 2020.08.26 | 2020.08.21 |
| 11 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.05.10 | 2020.05.05 |
| 12 | වගා හානි දැනුම් දියයුතු අවසන් දිනය | 2020.08.18 | 2020.08.13 |

1994 අංක 13 දරණ වාරිමාර්ග(සංශෝධිත) ආඥා පනතේ II උප වගන්තිය අනුව කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත රීති.

**01.** නියමිත දිනට බෙදුම් ඇළවල් හා කෙත් ඇළවල්වල තම කොටස් සුද්ධ පවිත්‍ර කර නඩත්තු නොකරන ගොවීන්ගෙන් බෙදුම් ඇළ බඹයකට රුපියල් 250.00ක්ද කෙත් ඇළ හා අපවහන ඇළ බඹයකට රුපියල් 200.00ක්ද දඩ මුදල් ලෙස අය කිරීම

**02.** නියමිත දිනට කෙත් ඇළවල් හා බෙදුම් ඇළවල් වල තම කොටස් නඩත්තු නොකරන ගොවීන්ගෙන් මීටරයකට රු.150.00 ක මුදලක් ගො/ ස ට අය කළ හැක.

**03.** පිදුරු ගිණි තැබීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.අක්කරයක පිදුරු ගිණි තැබීමක් කළහොත් එම තැනැත්තා රු. 2000.00 ක මුදතක් ගෙවිය යුතු අතර ඒ හා සමාන කාබනික පොහොර ප්‍රමාණයක්ද කුඹුරට යෙදිය යුතුය.අදාල කොටස භාර කෘ.ප.නි.ස වරයා විසින් ඒ පිළිබඳ වාර්තාවක් ගොවිජන සංවර්ධන නිලධාරීවරයාගේ නිර්දේශයක් සහිතව ගොවි සංවිධානයට ලබා දිය යුතුවේ.

**04.** ගවයින් නිදැල්ලේ යැවීම සම්පූර්ණයෙන්ම තහනම් වන අතර වගා හානියක් සිදු වුවහොත් ගොවිජන සංවර්ධන පණතට අනුව ද , වාරි පද්ධතියට හානියක් සිදු වුවහොත් වාරිමාර්ග පණතට අනුව ද කටයුතු කළ යුතුය.

**05.** වාරි පද්ධතියට හා නිර්මිත වලට හානිකිරීම වෙනුවෙන් දඩ අය කිරීම වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ තාක්ෂණ නිළධාරීන්ගේ තක්සේරුව අනුව සිදු කිරීම.

**06.** බෙදුම් ඇළෙන් පහළ කොටසේ නඩත්තු කටයුතු සඳහා අක්කර 01ට රු.150.00ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

**07.** ගොඩ ඉඩම් ,අනවසර ඉඩම්, රක්ෂිත ඉඩම් වාරිමාර්ග ජලයෙන් වගාකිරීම සම්පූර්ණයෙන් තහනම්.

**08.** බෙදුම් ඇළෙන් සහළ නඩත්තු කටයුතු සඳහා ගොවි සංවිධානය විසින් තීරණය කරණු ලබන ඕනෑම අවස්ථාවක සාමාජිකයා විසින් ශ්‍රම දායකත්වය ලබාදිය යුතුයි.එසේ නොවන්නේ නම් එම වටිනාකම මුදලින් ගෙවිය යුතුයි.

**09.** වගා රැස්වීමේ තීරණ වලට පටහැනිව ජලය ලබා ගැනීම හා වාරිමාර්ග නිර්මිත වලට හානි කිරීම කළහොත් වාරිමාර්ග පණතට අනුව දඩය අය කිරීමට ගොවි සංවිධාන වලට බලය දිය යුතුය.අනවසරයෙන් ජලය ලබා ගැනීම වරදක් වන අතර කෙත් ඇළ නියෝජිත මහතුන්ගේ අනු දැනුමකින් තොරව ජලය ලබා ගැනීම වෙනුවෙන් ගොවි සංවිධාන තීරණය කරන දඩ මුදලක් අය කර ගැනීමේ බලය ගොවි සංවිධානයට පැවරේ.අවශ්‍ය අවස්ථා වලදී තක්සේරු කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරේ.එසේම අනවසරයෙන් හෝ බලහත්කායෙන් ජල පොම්ප භාවිතයෙන් හෝ වාරි ජලය ලබාගෙන රක්ෂිත , ගොඩ ඉඩම් හෝ අනවසර ඉඩම් වගා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

**කාලිංග ගො/ස ගරු සභාපති ජී. ඒ. ෂෙල්ටන් පෙරේරා මහතා විසින් ඉහත කාල සටහන හා වගා රීති 2020 යල කන්නය සඳහා සුදුසු බවට යෝජනා කළ අතර එම යෝජනාව මහවැලි ගො/ස ගරු සභාපති යූ.පී. සමන්ත කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.**

විශේෂ කරුණු

**01. ගරු සභාපති - අරුණලු ගොවි සංවිධානය.**

ව්‍යාපාරය සඳහා නව වැඩසටහනක් නිර්මාණය කිරීම හා ගොවීන් සහ ගොවි සංවිධාන අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම පිණිස ඉදිරි යල් කන්නය ආරම්භයේදී වප් මගුල් උත්සවයක් පැවැත්වීමට දැනට කටයුතු යොදමින් පවතී. ජලය නිකුත් කරන දිනය පාදක කරගෙන නිශ්චිත දිනයක් ඉදිරියේදී දැනුම් දෙන බවත් මෙහි සියලුම පිරිවැය සිංහ සමාජය හරහා සිදු කරන බවත් දැන්වීය. මේ සඳහා සියලුම ගොවි නායකයින්ගේ සහ ප්‍රදේශයේ රාජ්‍ය ආයතන වල සහයෝගය අවශ්‍ය වන බව ප්‍රකාශ කරන ලදි. දියසෙන්පුර කෙත් යායෙහි මෙම කටයුත්ත සිදු කිරීමට අදහස් කරන අතර පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් තුමා ඇතුලු සියලු ආයතන මේ සඳහා සහභාගී කරවා ගැනිමට අපේක්ෂා කෙරේ.

ගරු සභාපති - පුබුදු ගොවි සංවිධානය.

මෙම කටයුත්ත ඉතා වැදගත් හා සංස්කෘතිමය වටිනාකමකින් හෙබි එකක් වන බැවින් ඒ සඳහා අවශ්‍ය අපරිම සහයෝගය ව්‍යාපාරයක් ලෙස සියලුම ගොවි සංවිධාන විසින් ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**02. ගරු සභාපති - මහවැලි ගොවි සංවිධානය.**

පොහොර සහනාධාරයට සමගාමීව ගොවීන් වෙත ලබා දෙන රක්ෂණාවරණය තුළ කීඩෑ හෝ වෙනත් කෘමි උවදුරු ඇතුළත් නොවීම විශාල ගැටලුවකි. මෙම කන්නයේ වී වගාව සඳහා කීඩෑ හානිය ප්‍රබල ලෙස පැමිණිය හැකි අතර මෙම අවධානම නිසාම මේ වන විට ගොවීන් විසින් විශාල මුදලක් වැය කර කෘමි නාශක යොදා ඇත. හදිසියේ හෝ උවදුර හානිකර ලෙස පැතිරී වගාවන් විනාශ වුවහොත් එම ගොවීන් හට කිසිදු පිළිසරණක් නොලැබෙන බව දැන්වීය.

**නේවාසික ව්‍යාපෘති කළමනාකරු.**

දැනට ක්‍රියාත්මක වන රක්ෂණාවරණය වලංගු වන්නේ ගංවතුර,නියගය හා වන අලි හානි සඳහා පමණකි. වෙනත් උවදුරු සඳහා වන්දි මුදල් ලබා ගැනීමට නම් අමතර රක්ෂණ ක්‍රමයක් වෙත යොමුවී තිබිය යුතුය. කෙසේ වෙතත් ගොවීන්ගේ ඉල්ලීම් ඉටු කර ගැනීම සඳහා මෙම අමතර රක්ෂණාවරණයට ඇතුළත් වීමට ගොවීන් කටයුතු කළ යුතු බව පවසන ලදි.

**03. ගරු ලේකම් - ඒකාබද්ධ ගොවි සංවිධානය.**

නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල භූමිය තුළ පැළ රෝපණය කිරීමේ වැඩසටහනෙහි මූලික කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. නමුත් මෙම පැළ සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබා ගැනීම මූලික ගැටලුවක් වී තිබේ.ඒ අනුව අදාල පැළ ප්‍රමාණය ගොවි සංවිධාන 25 ට සම අයුරින් බෙදී යන පරිදි වෙන් කර දී නඩත්තු කරගෙන යාම සිදු කළ යුතුව ඇත.වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් මේ සඳහා උපකරණ පද්ධතියක් ලබා දීමට කටයුතු කරන බවට තොරතුරු ලැබී ඇති නමුත් එම උපකරණ ලැබෙන තුරු මෙම ජලය සැපයීමේ කටයුතු ගොවි නායකයින් විසින් සිදු කරගෙන යා යුතුය.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ජල ටැංකි කිහිපයක් ලබාගෙන , වෙනත් ක්‍රමයක් මගින් මෝටරයක් හා ජල නල පද්ධතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.ඒ අනුව 2020/03/19 දින මෙම පැළ රෝපණය කිරීමේ කටයුතු සිදු කිරීම සුදුසු බවත් ඒ සඳහා සියලු ගොවි නායකයින් සහභාගී විය යුතු බවත් කමිටුවට දැන්විය.

- මහවැලි ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ මැදිරිගිරිය ගංගා ද්‍රෝණි වැඩසටහන දැනට අවසන් වී ඇති නිසා එම ආයතනය මගින් මෙම උපකරණ ලබා ගැනීමේ හැකියාව පවතින බවයි.ඒ සඳහා නේවාසික ව්‍යාපෘති කළමනාකරුගේ සම්බන්ධීකරණ සහයෝගය ඉල්ලා සිටින ලදි.
- කාලිංග ගොවි සංවිධානයේ ගරු සභාපති දන්වා සිටියේ පැළ රෝපණය කිරීමේ වැඩසටහන ඉදිරි 19 දින ආරම්භ වනවානම් ඉන් ඉදිරියට පැළ සඳහා අවශ්‍ය ජල පහසුකම් ද ලබා ගත යුතුය. එසේ නොවුණහොත් අධික වියළි කාලගුණ තත්වය නිසා පැළ විනාශ විය හැකි බව පැවසීය. මේ සඳහා දෛනිකව ජලය ලබා දීම ආයතනයේ නිලධාරීන් හට අසීරු කාර්යයක් බැවින් ඒ සඳහා සියලු ගොවි සංවිධාන සහය දිය යුතුය.
- මහින්දපුර ගරු සභාපති පැවසුයේ ගොවි සංවිධාන සියල්ලේම නිලධාරීන් මේ සඳහා ඉදිරිපත් වුවහොත් මෙම ජලය සැපයීමේ ගැටලුව කිසි සේත්ම ඇති නොවන බවයි.
- විජිත ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ මෙම පැළ නඩත්තු කිරීම සඳහා නිරන්තරයෙන් මෙම ස්ථානයට පැමිණීමට හැකියාවක් නොමැති බවයි. පෞද්ගලික කටයුතු, කන්නයේ ඉතිරි කටයුතු , ගොවි සංවිධානයේ අභ්‍යන්තර කටයුතු ආදී සියල්ල ද ඉටු කළ යුතු බැවින් මේ සඳහා වෙනත් ක්‍රියාමාර්ගයක් යෙදීමට සිදුවන බව දැන්වීය.
- ශ්‍රී නාග ගොවි සංවිධානයේ ගරු ලේකම් පෙන්වා දුන්නේ මෙම කටයුත්ත ස්ථාවරව හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සුදුසු එක් පුද්ගලයෙක් යම් වේතනයක් ලබා දී යෙදවීම පහසු බවයි.
- රංකෙත ගොවි සංවිධානයේ ගරු සභාපති පැවසුයේ මේ සඳහා යොදවන පුද්ගලයා සඳහා යම් වේතනයක් ලබා දීමට අවශ්‍ය නම් මාසිකව එක් ගොවි සංවිධානයකින් රු. 500.00 ක් ලබා දීම සුදුසු බවයි.

- **03. ගරු සභාපති - අරුණලු ගොවි සංවිධානය.**

  විශේෂයෙන්ම මෙවන් කටයුතු වලදී ගොවි සංවිධාන තම යුතුකම හා වගකීම් ඉටු කළ යුතුය. එපමණක්ම නොව විවිධ රැස්වීම් සහ ගැටලුකාරී අවස්ථා වලදී එක් ව්‍යාපාරයක් ලෙස සිට කටයුතු කිරීමට වග බලා ගත යුතුය.

**ගරු සභාපති - කාලිංග ගොවි සංවිධානය.**

ව්‍යාපාරය තුළ සිදුවන සියලුම කටයුතු පිළිබඳව සියලු ගොවි නායකයින් දැනුවත් විය යුතු අතර එක් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට උත්සාහ කළ යුතුය. දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධානයට කවුඩුලුවැව ව්‍යාපාරයෙන් දැනට ගෙවිය යුතු හිඟ මුදල් ද ගෙවා නිම කරන ලෙස පැවසීය.

**ගරු සභාපති - එක්සත් 01 බී ගොවි සංවිධානය.**

දිස්ත්‍රික් ගොවි සංවිධානයේ උප සභාපති ලෙස මෑතකදී පත්වූ කවුඩුලුවැව එක්සත්, ගොවි ගොවි සංවිධානයේ ගරු සභාපති එම කටයුතු සඳහා දක්වන දායකත්වය අවම තත්වයේ පවතින බව කමිටුව හමුවේ ප්‍රකාශ කරන ලදි.එසේම ජාතික ගොවි සංවිධානය විසින් මේ වන තෙක් කිසිදු කාර්යයක් ගොවීන් සඳහා ඉටු කර නොමැති අතර එම නිසාම මෙම ජාතික ගොවි සංවිධානය ව්‍යාපාරයන් තුළ පැවතීම තව දුරටත් අවශ්‍ය නොවනු ඇත.

**<u>ස්තූති කථාව - ගරු සභාපති - ඒකාබද්ධ ගොවි සංවිධානය</u>**

- මෙවර **2020** යල කන්නයට අදාලව පෙර වගා රැස්වීම සාර්ථක කරගැනීමට පැමිණි සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්,රාජ්‍ය නිලධාරීන් සහ ගොවි සංවිධාන නිළධාරීන්ට ස්තූති කරමින් ඉදිරි යල කන්නය සාර්ථක වීම සඳහා සියලු ගොවි ප්‍රජාවට සුභාශිංෂණ පළ කරමින් කමිටු රැස්වීම අවසන් කරන ලදි.

.......................................

**ආර්.ඩී.කේ රාජසූරිය,**
**නේවාසික ව්‍යාපාර කළමනාකරු,**
**කවුඩුලුවැව ව්‍යාපාරය,**
**මැදිරිගිරිය.**

**පිටපත් -**

1. දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව. - කා.දැ.ස
2. අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය. - කා.දැ.ස
3. ප්‍රාදේශීය ලේකම්,මැදිරිගිරිය. - කා.දැ.ස
4. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
5. ගොවිජනසේවා නියෝජ්‍ය කොමසාරිස,පොළොන්නරුව. - කා.දැ.ස
6. කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
7. අන්තර් පළාත් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ. - කා.දැ.ස
8. වාරිමාර්ග ඉංජිනේරු.කවුඩුලුවැව - කා.දැ.ස
9. ගො.ස.ප්‍රා. නිලධාරී,මැදිරිගිරිය. - කා.දැ.ස